විමර්ශි 33

## තිස්සනායගම්ට දැමූ විලංගුවේ බර

ප්‍රජාතන්ත්‍රවාදය අගයන සිවිල් සමාජයත්, ජාත්‍යන්තරයත්, විශේෂයෙන් ජාත්‍යන්තර මාධ්‍ය ප්‍රජාවත්, කම්පාවට පත් කළ, එමෙන්ම ඒ කිසිවකු කිසිසේත් සාධාරණ යැයි පිළි නොගන්නා නඩු තීන්දුවකින් මාධ්‍යවේදී ජේ. එස්. තිස්සනායගම් (තිසෙයිනායගම්) වසර 20ක බරපතල වැඩ සහිත සිර දඬුවමකට යටත්ව මේ වන විට සිරගතව සිටී. අගෝස්තු මස 31 වැනිදා දුන් එම තීන්දුවෙන් පසු මේ වන විටත් සිවිල් සමාජය හා මාධ්‍ය ක්‍රියාකාරීන් අතර ප්‍රබලම මාතෘකාව බවට පත් වී ඇත්තේ මෙම සිදුවීමය. මෙම නඩු තීන්දුව සමඟ මේ රටේ සමහර මාධ්‍ය තුළ යම් තරමකින්ද, සිවිල් සමාජය තුළ වඩා ගැඹුරින්ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා හදිසි නීතිය නිසා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස බරපතල අණතුරකට ලක්වී ඇති ආකාරය පිළිබඳ කතිකාවක් මතු වී ඇත. ඒ අතර චෝදනා තුනකට ඔහුට නියම කළ වසර 20ක කාලය වසර දහයකින් ගෙවී යන ආකාරයට ඉල්ලීමක් විත්තියේ නීතිඥයාගෙන් සිදු නොවීමෙන් වසර 20ක සිර දඬුවම් ඔහුට නියම වූ බව මෙන්ම, විත්තියේ නීතිඥවරයාගෙන් සිදු වූ තවත් දුර්වලතා කිහිපයක්ම කතා බවට ලක් වී තිබේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත නම් කුරිරු නීතිය යටතේ සිර ගෙට නියම වූ අවසන් මාධ්‍යවේදියා නොවිය හැකි නමුත් පළමු මාධ්‍යවේදියා බවට පත් වූ ඔහු වෙනුවෙන් ඉදිරිපත් වූ සමහර සාක්ෂිවලින්ද ඔහුට අවාසියක් වූ ආකාරයද මේ නඩු තීන්දුව විමර්ශනයට ලක් කළ සමහර මාධ්‍ය වාර්තාවලින් අනාවරණය වී ඇත.

කෙසේ වෙතත් ඔහුට ඉදිරිපත් වී ඇති චෝදනාවල නිමිත්ත ඔහු විසින් පළ කළ ''නෝර්ත් ඊස්ටන් මන්ත්ලි'' නම් සඟරාවයි. 2006 ජූනි 01 සිට 2007 ජූනි 01 දක්වා අතර කාලය තුළ ඔහු විසින් ලියන ලද ලිපි දෙකක කරුණු එක් චෝදනාවකට හේතු වී ඇත. සඟරාව පළ කිරීම හා බෙදා හැරීම අනෙක් චෝදනාවයි. ඒ චෝදනා වෙනුවෙන් වසර පහ බැගින් සිර දඬුවම් නියම වී ඇත. එම සඟරාව හරහා ත්‍රස්තවාදය සඳහා මුදල් එකතු කිරීම වසර දහයක සිර දඬුවම් නියම වූ චෝදනාවයි. නිරීක්ෂණය කළ කාලය තුළ මාධ්‍යවල වාර්තා වූ ආකාරයට අදාල ලිපිවලින් ඔහු ඉදිරිපත් කර ඇත්තේ යුදමය තත්ත්වය තුළ දෙමළ ජනතාවට සිදු වූ හිරිහැර ගැනය. පෙනෙන ආකාරයට එය මානුෂවාදී පුවත් වාර්තාකරණයකි. එම කරුණුවල සත්‍ය අසත්‍යතාවය නඩු තීන්දුවකට දූන් යටත්ය. නමුත් දෙමළ ජනතාව වෙනුවෙන් මානුෂවාදී පුවත් වාර්තා කළ දෙමළ මාධ්‍යවේදියකු වූ තිස්සනායගම්ට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඉතාම අසාමාන්‍ය සිර දඬුවමක් නියම වීම ගැන ශ්‍රී ලංකාවේ මාධ්‍ය කල්පනා කරන ආකාරය ගැන වටහා ගැනීම වැදගත්ය.

නඩු තීන්දුව දුන් අගෝස්තු මස 31 වැනි සඳුදා සිට ඔක්තෝබර් මස 06 වැනිදා දක්වා සතියක කාලය තුළ මාධ්‍ය නිරීක්ෂණය කරන විට මෙම නඩු තීන්දුව හරහා මාධ්‍යයට එල්ල වී ඇති තර්ජනය ගැන එතරම් ප්‍රබල කතා බහක් පොදුවේ මාධ්‍ය විසින් මතු කර ඇති බවක් නොපෙනේ. සිදුවීම වාර්තා කිරීමේදී යම් සමබර බවක් මෙන්ම ඒ වාර්තාකරණය හරහා අනතුර ගැන හැඟීමක් සමහර මාධ්‍ය මඟින් ඇති කළද අනතුර ගැන ප්‍රමාණාත්මක කතිකාවක් මතු කිරීමට උත්සාහ ගෙන ඇති බවක් නොපෙනේ. රජයේ මාධ්‍ය මෙන්ම ජාතිවාදී වාර්තාකරණයේ වඩා ප්‍රමුඛයන් වූ සමහර මාධ්‍ය තිස්සනායගම් වැරැදිකරුවකු කර දඬුවම සාධාරණීකරණය කරන ආකාරයකින් වාර්තා කිරීමද කැපී පෙනෙයි. ඒ අතරින් සුළුතරයක් මාධ්‍ය ආයතන මෙන්ම මාධ්‍යවේදීන් කිහිප දෙනෙකු මාධ්‍ය වෙත එල්ල වී ඇති අනාගත අනතුර දකිමින් හා තිස්සනායගම් ඉතා අසාධාරණ ලෙස චූදිතයකු කළ ආකාරය පෙන්නා දෙමින් වඩා ශක්තිමත් කතිකාවක් ගොඩ නගන්නට හුදකලා උත්සාහයක යෙදී ඇත.

නිරීක්ෂණය කරන ප්‍රධාන සිංහල දිනපතා පුවත්පත් හතර තීන්දුවට පසු දින ඒ ගැන වාර්තා කළ නමුත් පුවත්පත් දෙකක් (ලංකාදීප, ලක්බිම) එය පළ කර තිබුණේ මුල් පිටුවේ කුඩා පුවත් ලෙස පමණි. නඩු තීන්දුව ගැන ඉතා කෙටියෙන් එක් පුවතක සඳහන් කර තිබූ අතර අනෙක් පුවත්පත (ලංකාදීප) ඊට වැඩි විස්තරයක් පළ කර තිබිණ. එයට තිස්සනායගම් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා ඔහුගේ මාධ්‍ය කාර්යභාරය අගයමින් කළ ප්‍රකාශය ඇතුළත් කිරීමෙන්, තිස්සනායගම් දෙමළ ජනතාවගේ මානුෂවාදී ගැටළු වෙනුවෙන් පමණක් නොව සිංහල ප්‍රජාවගේ මානව හිමිකම් වෙනුවෙන්ද පෙනී සිටි මහජන සේවා මාධ්‍ය කාර්යභාරයක් ඉටු කළ

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

කෙනෙකු බව තම පාඨකයන්ට හඳුනා ගැනීමට සලස්වා ඇත. නමුත් සිරස්තලය සමඟ ඇති උප සිරස්තලයට යොදා ඇති **''ජාතිවාදය ඇවිස්සීමේ - ත්‍රස්තයන්ට ආධාර කිරීමේ චෝදනාවලට වරදකරු''** යන වගන්තියෙන් පුවත්පත දරන මතය යම් තරමකට ඇතුළත් වී ඇති ආකාරය වටහා ගත හැකිය. කෙසේ වෙතත්, පුවත්පත් දෙකක (දිනමිණ, දිවයින) ප්‍රධාන පුවත තිස්සනායගම් නඩු තීන්දුව වුවත්, මුලින් කී පුවත්පත් දෙකටම වඩා වෙනස්ව තීන්දුව සාධාරණීකරණය කරන නැඹුරුවකින් එය වාර්තා කර ඇත. අදාල කාලය තුළ පුවත්/විශේෂාංග/කතුවැකි/තීරුලිපි 18ක් පමණ සිංහල පුවත්පත්වල පළ වී තිබිණ. එක් පුවත්පතක ඉරිදා සංග්‍රහයේ (ඉරිදා ලක්බිම) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට බරපතල අනතුරක් වන ආකාරය අවධාරණය කරන කතුවැකියක් තිබීම විශේෂය. සිංහල පුවත්පත් සියල්ල අතර, රාවය පුවත්පතේ ජනරංජන ලියූ ලිපියක් ඉතා විශේෂ බැවින් නමින් සඳහන් කිරීම වරදක් විය නොහැකිය. එය තිස්සනායගම් අත්අඩංගුවට ගැනීමේ අසාධාරණයේ සිට නීතියේ සමාන සැලකීම ලබා ගැනීමේදී ටීඅයිඩීය සහ නීතිපති දෙපාර්තමේන්තුව ඔහුට සිදු කළ අසාධාරණකම්, නඩු තීන්දුව ආදී සියළු විස්තර ඇතුළත් විග්‍රහයකි. එම ලිපිය ආරම්භ වන්නේ තිස්සගේ මාධ්‍ය මෙහෙවර අගයමින් ඔහු ජාතිවාදියකුවත්, වාර්ගික වෛරය වපුරවන්නට උත්සාහ කළ අයකුවත් නොවන බව අවධාරණය කරමින්, මෙම නඩු තීන්දුවෙන් මාධ්‍ය නිදහසට කරන බරපතල අනතුරු ඇඟවීම මතක් කරමින් තිස්සගේ නීතිඥවරයා කළ ප්‍රකාශයකිනි. තිස්සනායගම්ට දෙන ලද දඬුවම නීතියේ සමතුලිතතාවය ඉක්මවා ගිය කෲර හා අමානුෂික එකක් බවත්, තමන්ගේ හෘද සාක්ෂිය ලියා පළ කිරීම නිසා මාධ්‍යකරුවකු අවුරුදු විස්සක සිර දඬුවමකට යටත් කිරීම කවර අතින් බැලුවත් පමණ ඉක්මවා ගිය දඬුවමක් බවත් සඳහන් වන එම ලිපියෙන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉතාම පක්ෂග්‍රාහී ලෙස මාධ්‍ය මර්දනයට යොදා ගත හැකි ආකාරය පිළිබඳ අවබෝධයක් පාඨක ප්‍රජාව වෙත ලබා දෙයි. ''ලිපි දෙකක් ලියුවාට අවුරුදු විස්සක් හිරේ දමන රටක්'' යන සිරස්තලය ලිපියට යොදා ගැනීමෙන්ද මේ රටේ මාධ්‍ය නිදහසට එල්ල වී ඇති තර්ජනය මෙන්ම අධිකරණයේ සාධාරණත්වයද ප්‍රශ්නකාරී බව ඒත්තු ගැන්වේ. මෙම පුවත්පත තවත් ලිපි/කොළම්/පුවත් කිහිපයක් පළ කිරීමෙන් සිදුවීමට ප්‍රමුඛතාවක් ලබා දී ඇත. තිස්සනායගම්ට නිර්භීත සහ ආචාරධාර්මික මාධ්‍යවේදියාට පිරිනමන පීටර් මැක්ලර් සම්මානය පිරිනැමීමට දේශ සීමා රහිත මාධ්‍යවේදීන්ගේ සංවිධානය තීරණය කර ඇති බව මුල් පිටුවේ පුවතකින් වාර්තා කර ඇත්තේද මෙම පුවත්පතයි. ඔහුට මාධ්‍ය නිදහස සඳහා සම්මානය පිරිනැමීමට පුවත්පත් කලාවේදීන් සුරැකීමේ කමිටුව තීරණය කර ඇති බව වාර්තා කර ඇති බව තවත් පුවත්පතක් (ලංකාදීප) වාර්තා කර තිබිණ.

දෙමළ මාධ්‍ය පුවත්පත් හතරම නඩු තීන්දුව සිය ප්‍රධාන පුවත ලෙස වාර්තා කළද රජයේ දෙමළ මාධ්‍ය පුවත්පතේ (තිනකරන්) නැඹුරුව තීන්දුවට පක්ෂපාතී වන ආකාරයට ඉදිරිපත් වී ඇත. අනෙක් පුවත්පත් තුන (සුඩර් ඔලි, තිනක්කුරල්, වීරකේසරී) තිස්සනායගම්ගේ නීතිඥවරයාගේ ප්‍රකාශද සහිතව වාර්තා කර ඇත. ඒ හරහා තිස්සනායගම් ඉටු කළ මාධ්‍ය කාර්යභාරයේ වැදගත්කම හා තීන්දුවේ බරපතලකම අවධාරණයට ලක්වේ. නිර්භීත හා ආචාරධාර්මික මාධ්‍යවේදය වෙනුවෙන් පිරිනැමෙන පීටර් මැක්ලර් සම්මානය හා මාධ්‍ය නිදහස සම්මානය ඔහුට පිරිනැමෙන බව දෙමළ පුවත්පත් තුනම වාර්තා කරයි. විශ්වාස කිරීමට නොහැකි නඩු තින්දුව ගැන කම්පා වෙමින්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මාධ්‍ය මර්දනයට කරන බලපෑම හෙළා දකිමින්, විවිධ ජාත්‍යන්තර සංවිධාන/පුද්ගලයන් කළ ප්‍රකාශ ගැන වැඩි අවධානය යොමු කර ඇත්තේද මෙම දෙමළ පුවත්පත් තුනයි. ප්‍රධාන සිරස්තල ඇතුළුව පළ කර ඇති මුළු වාර්තා ගණන 33කි. ඒ අතර කතුවැකි තුනකින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ භයානක බව සාකච්ඡාවට ගනිමින් තිස්සනායගම් නඩු තීන්දුව විමර්ශනය කර ඇත. දිනපතා අනෙක් පුවත්පත් මෙන් දෙමළ පුවත්පත්ද නඩු තීන්දුව ගැන රජයේ නියෝජිතයන් කළ ප්‍රකාශවලටද සමාන අවස්ථා ලබා දී ඇත.

පශ්චාත් යුද සමය සමඟ සමබර වාර්තාකරණයක් පෙන්නුම් කරන දිනපතා ඉංග්‍රීසි පුවත්පත (ඩේලි මිරර්) මෙම නඩු තීන්දුව සම්බන්ධයෙන්ද එවැනි වාර්තාකරණයක් පෙන්නුම් කරයි. තිස්සනායගම්ගේ මාධ්‍ය මෙහෙවර, නඩු තීන්දුව, තිස්සගේ නීතිඥ අනිල්ද සිල්වාගේ ප්‍රකාශ හරහා සිය පාඨකයන්ට තේරුම්ගත හැකි ආකාරයට ප්‍රධාන පුවතක් ලෙස නඩු තීන්දුව වාර්තා කර ඇත. එමෙන්ම සතියේ මාධ්‍ය සාකච්ඡාවේදී අනුර ප්‍රියදර්ශන යාපා මේ සම්බන්ධයෙන් කළ ප්‍රකාශද වාර්තා කර ඇත්තේ ප්‍රධාන පුවතක් ලෙසය. මෙම පුවත තුළද තිස්සනායගම් සිර

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

ගෙදරට කැඳවා ගෙන යන ඡායාරූපයක් සමග අත්අඩංගුවට ගැනීම හා නීතිය හමුවට ඉදිරිපත් කිරීම්වලට අදාල සටහන් කිහිපයක්ද ඇතුළත් කරමින් බුද්ධිමත් පාඨක ප්‍රජාවට තේරුම් ගත හැකි ආකාරයේ සමබර වාර්තාකරණයක් කරයි. රජයේ මාධ්‍ය පුවත්පත එම ආයතනයේ සිංහල දෙමළ පුවත්පත් මෙන්ම නඩු තීන්දුව සාධාරණ බව ඇඟවෙන එක් වාර්තාවක් පළ කොට ඇති අතර තවත් ඉංග්‍රීසි පුවත්පත් කිහිපයක්ද එවැනි නැඹුරුවකින් කටයුතු කර ඇත. තවත් පුවත්පතක් (අයිලන්ඩ්) ප්‍රධාන සිරස්තලයක් යොදා ඇත්තේ තිස්සනායගම් නඩු තීන්දුව දුන් දිනයේ විනිසුරුවරියට ආරක්ෂාවක් නොතිබූ බව වාර්තා කරන්නටය. තිස්සනායගම් තීරු ලිපියක් ලිවූ බවට සඳහන් පුවත්පත (සන්ඩේ ටයිම්ස්) ඉතා කුඩා වාර්තා දෙකකට පමණක් සීමා වී ඇති අතර තම මාධ්‍යවේදියාට සිදු වූ අසාධාරණය ගැන හැඟීමක් එයින් ඉදිරිපත් නොවේ. ඉංග්‍රීසි පුවත්පත් අතරින් වඩා විග්‍රහාත්මක වාර්තාකරණයක යෙදී ඇත්තේ සති අන්ත ඉංග්‍රීසි පුවත්පතක් වූ සන්ඩේ ලීඩර් බව කැපී පෙනෙයි. කතුවැකියක්, පුරා පිටු දෙකක විශේෂාංගයක් සහ තවත් ලිපි දෙකක් මූලික වශයෙන් මෙම සිදුවීම වෙනුවෙන් වෙන් කොට ඇත. චෝදනා පත්‍රයේ සාරාංශයක්, තිස්සගේ පාපෝච්චාරණය සහ ඔහු වරදකරු කළ ඔහු ලියූ ලිපි දෙකද පළ කර ඇති පිටු දෙකේ විශේෂාංගයෙන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මාධ්‍ය මර්දනයට අනතුරක් වී ඇති ආකාරය වෙනත් වචනවලින් තොරව පැහැදිලි කරයි. එම පුවත්පතේ කතුවැකියෙන්ද මෙම සිදුවීමෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා කරන බලපෑම අවධාරණය කරයි. සිදුවීම පාදක කොට ගෙන කාටූන් ඉදිරිපත් කර ඇත්තේ ඉංග්‍රීසි පුවත්පත් පමණය. එය ගණනින් 4කි.

ජාතික රූපවාහිනිය හැර අනෙක් රූපවාහිනී සේවා නඩු තීන්දුව සම්බන්ධයෙන් වාර්තා කළ අතර සිරස රූපවාහිනී ජලය එය තම දෙවැනි ප්‍රධාන පුවත ලෙස වාර්තා කළේය. දෙරණ රූපවාහිනියද තම සිරස්තලවලට අයත් පුවතක් ලෙස එය වාර්තා කළ අතර එතරම් ප්‍රමුඛතාවක් නොදක්වා ස්වාධීන රූපවාහිනියද එය වාර්තා කර තිබුණි. මෙයින් සිරස ජාලයේ වාර්තාකරණය විස්තර සහිත මෙන්ම නඩු තීන්දුවේ අනතුරුද අඟවන එකක් විය. ඒ සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ ලේකම්වරයාගේ ප්‍රකාශයක්ද එක් කොට ගෙන තිබිණ. නමුත් දෙරණ සහ ස්වාධීන රූපවාහිනියේ වාර්තාකරණය සමානකමක් දක්නට ලැබිණ. රජයේ පුවත්පත් වාර්තාකරණය හා සමාන නැඹුරුවක් ඒවායේ විය. තිස්සට පීටර් මැක්ලර් සම්මානය හිමිවන පුවත වාර්තා කර ඇත්තේ සිරස මාධ්‍ය ජාලය පමණි. කෙසේ වුවත්, මුද්‍රිත මාධ්‍යයට සාපේක්ෂව විද්‍යුත් මාධ්‍යවලින් ගොඩ නැගු කතිකාව දුර්වල බව මේ අනුව පෙනේ.

තිස්සනායගම්ගේ නීතිඥවරයා අධිකරණයට ප්‍රකාශ කළ ආකාරයට තිස්සගේ ඉරණම යනු, අනාගතයේ මේ රටේ මාධ්‍යකරුවන් හැසිරිය යුතු ආකාරය උගන්වන පාඩම බව බොහෝ මාධ්‍ය වාර්තාවලින් කියැවිණ. ඔහුට අත්වූ ඉරණමෙන් පසු ලෝකය කම්පා වුවත් ශ්‍රී ලාංකික මාධ්‍ය ක්ෂේත්‍රයේ කොඳු ඇති සමහර නිර්භීත මාධ්‍යවේදීන් පමණක් මේ අනතුර ගැන හඬගා කියද්දී සෙසු අයගෙන් කොටසක් නිහඬව හෝ කොටසක් දඬුවමට පක්ෂපාතී වාර්තාකරණයකට හෝ සීමා වී සිටින්නේ ඉහත කී පාඩම ගැන බිය වී ඇති නිසාද? තමන්ට එවැනි අනතුරක් නොවිය හැකි බවට ඇති විශ්වාසය නිසාද? නැතිනම් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට ගොදුරු වූ පළමු මාධ්‍ය බිල්ල වූ තිස්සනායගම් දෙමළ මිනිසකු වූ නිසාද? වෙනත් ආකාරයකට කියතොත් සිංහල ජාතිවාදය ඇවිස්සෙන සුළු වාර්තාකරණයන්, අදහස් ප්‍රකාශනයන් ඉතිහාසයේ සිට ඇති තරම් දැක අසා ඇති සමාජයකට වැරැද්ද ලෙස පෙනෙන්නේ දෙමළ ජාතිවාදය ඇවිස්සෙන සුළු යැයි කියන වාර්තාකරණයක් පමණක් නිසාද?

**සීතා රංජනී**
**seetha@cpalanka.org**

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com